අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | Fax +94112784846
isurupaya@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/12/1/5/2/16 | ඔබේ යොමුව / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date 2021.08. 15

සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්,
සියලුම ගුරු විද්‍යාල විදුහල්පතිවරුන්,
සියලුම ජාතික පාසැල් විදුහල්පතිවරුන්,

**සියලුම ඒකාබද්ධ සේවයේ නිලධාරින්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2022**

රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකර ඇති ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක COMS/Trans/V/වා.ස්.මා.2022 හා 2021.08.06 දිනැති ඒකාබද්ධ සේවා චක්‍රලේඛ 01/2021 හා බැඳේ.

02. ඒ අනුව ඔබ කාර්යාලය/විද්‍යාපීඨය/විද්‍යාලය/ආයතනය මගින් පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන කරනු ලබන ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් ඉහත චක්‍රලේඛයේ උපදෙස් පරිදි පහත සඳහන් කරුණු පිළිබඳ විශේෂ අවධානය යොමු කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

I. ස්ථාන මාරු අයදුම් කරන සියලුම නිලධාරීන් මාර්ගගත මෘදුකාංගය (Online Application ) තුලට පිවිස වාර්ෂික ස්ථානමාරු අයදුම්පත සම්පූර්ණ කර එහි දෘඪ පිටපත (Hard Copy ) ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව 2021.09.10 දිනට පෙර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කිරීම සඳහා පිටපත් 02කින් යුතුව **අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.**

II. අදාළ සේවා ස්ථානයේ වසර 05ට වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන්ගේ තොරතුරු ද මාර්ගගත මෘදුකාංගය (Online Application ) ඔස්සේ අනිවාර්යයෙන්ම යාවත්කාලීන කර එහි දෘඪ පිටපත (Hard Copy ) ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කිරීම සඳහා පිටපත් 02 කින් යුතුව මා වෙත ඉදිරිපත් කළ යුතුය.

III. එක් නිලධාරියෙකු එක් අයදුම්පතක් පමණක් යොමු කළ යුතුය.

IV. නිලධරයෙකුගේ ඉල්ලීමක් අනුව කරන ලද මාරුවීමක් අවලංගු කරන ලෙස හෝ කල් දමන ලෙසට පසුව අභියාචනා කිරීමට එම නිලධරයාට හෝ ඒ පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමට ආයතන ප්‍රධානියාට හිමිකමක්, නොමැති අතර විශේෂ පුහුණු ලබා ඇති නිලධරයෙකු සේවා අවශ්‍යතාවය මත තවත් වර්ෂයක් තම ආයතනය තුළ රඳවා ගත යුතු යැයි ආයතන ප්‍රධානියා අදහස් කරන්නේ නම්, නිර්දේශිත අයදුම්පත් යොමු කරන අවස්ථාවේදීම ඒ පිළිබඳව පැහැදිළිව සඳහන් කළ යුතුය.

V. සෑම නිලධරයෙක් පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට ආයතන ප්‍රධානීන් වගබලා ගත යුතු වේ. තවද සාවද්‍ය අසම්පූර්ණ තොරතුරු සපයා ඇති බව හෙළි වුවහොත් ඒ පිළිබඳව අදාළ ආයතන ප්‍රධානීන් හා එම ලැයිස්තු සකස් කළ හා හරි වැරදි බලන නිලධරයන් වගකීමට බැඳී සිටින අතර සාවද්‍ය කරුණු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

සුභාෂිණී කුලතුංග මුදලි
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ( ඒකාබද්ධ සේවා )
අධ්‍යාපන ලේකම් වෙනුවට